# ප්‍රගතිය හා නිගමන ඉදිරිපත් කිරීම

**01. ව්‍යාපෘතියේ නම - ලිංගිකත්වය හා ස්ත්‍රි පුරුෂ සමාජභාවය මත පදනම් වූ ගැටලු නිරාකරණය උදෙසා උපදේශන සේවය**

දිස්ත්‍රික්කය - පොලොන්නරුව ප්‍රා.ලේ.කාර්යාලය- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 07

**02. ව්‍යාපෘතියේ අරමුණු -**

**i.** සමස්ථ අරමුණ - **උපදේශන සේවය තුළින් ලිංගිකත්වය හා ස්ත්‍රි පුරුෂ සමාජ භාවය මත පදනම් වූ ගැටලු නිරාකරණය කර ගනිමින් සතුටු සමාජයක් නිර්මාණය කිරීමට පදනම දමන ලදි.**

ii. පහත විශේෂිත අරමුණු සියල්ල ලඟා කර ගැනීමට උත්සාහ කරන ලදි-

1. පිරිකම හෝ පුරුෂාධිපත්‍ය නිසා පිරිමින්ට සහ ගැහැනුන්ට සිදු වන අසාධාරණයන් හඳුනා ගැනීම
2. කාන්තාවක් හා ගැහැණු දරුවෙකු වීම නිසාම සිදු වන අසාධාරණකම් අවම කිරීම
3. තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී කාන්තා සහභාගිත්වය වැඩි කිරීම
4. මානව සම්බන්ධතා යහපත් කිරීම හා සංවර්ධනය කිරීම
5. කාන්තාව සම්බන්ධ නිතීය හා තොරතුරු ග්‍රාමීය ප්‍රජාවට ලබාදීම
6. සමාජ සංවිධාන බල ගැන්වීම
7. නායකත්ව කුසලතා තුළින් සතුටු පවුලක් හා සමාජයක් නිර්මාණය කිරීම
8. යොවුන් ළමයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ නිසි අවබෝධය හා මැදිහත් වීම බල ගැන්වීම
9. දරුවන්ට හා කාන්තාවන්ට ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරිම
10. පවුල් සම්බන්ධතා ධනාත්මක කිරීම
11. ගැටලු විශ්ලේෂණ හැකියාවන් පුද්ගලයන් තුළ වර්ධනය කිරීම
12. සමාජය හා පවුල තුළ යහපත් සන්නවේදන කුසලතා සංවර්ධනය කිරීම

## 03. සාකච්ඡාවට ලක් කරන ලද මාතෘකා -

1. පිරිමිකම හා ගැහැනුකම පාදක ගැටලු හඳුනා ගැනීම
2. කාන්තාවන් හා ගැහැණු දරුවන් වීම නිසාම සිදු වන අසාධාරණකම්
3. පවුල තුළ කාන්තාවන්ගේ කොටු වූ ජීවිත
4. කාන්තාවන්ට සිදු වන හිංසනයන්
5. මධ්‍යසාර භාවිතය හා ඉන් වැලකීම
6. පිරිමිකම තුළ පිරිමින්ගේ ජිවිත සීමා වීම
7. පිරිමිකම හා ගැහැණු කම ලිහා ගැනීම
8. ගැහැණුකම පිරිමිකමේ සිට මනුස්සකම වෙත
9. සතුට පිරුණු සෞඛ්‍යමත් පවුල
10. සතුටු පවුලේ සෞඛ්‍යවත් සන්නිවේදනය

## 04. වැඩසටහන් පවත්වන ලද ආකාරය දැක්වෙන කාලසටහන

| වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | දින ගණන | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පැවැත්වීමට නියමිත දින පෙබරවාරි |
|---|---|---|---|---|
| 01. කාන්තාවන් හා පවුලේ සාමාජිකයින් සහභාගිත්වයෙන් පැවැත්වෙන වැඩසටහන් | 04 | එක් දින | ලංකාපුර | 19 |
| | | | ඇලහැර | 23 |
| | | | තමන්කඩුව | 26 |
| | | | වැලිකන්ද | 15 |
| 02. ත්‍රිවිල්, පාසල් බස් රථ රියදුරන් පොලිස් නිලධාරින් හා පෞද්ගලික ආයතන නිලධාරින් | 03 | එක් දින | දිඹුලාගල | 22 |
| | | | හිඟුරක්ගොඩ | 20 |
| | | | වැලිකන්ද | 15 |
| 03. යොවුන් වියේ පිරිමි ළමුන් වැඩසටහන් | 03x02 | දෙදින | මැදිරිගිරිය | 15 |
| | | | | 16 |
| | | | ඇලහැර | 22 |
| | | | | 23 |
| | | | හිඟුරක්ගොඩ | 19 |
| | | | | 20 |
| 04. දහම් පාසල් ගුරුවරුන් වැඩසටහන් | 04 | එක් දින | මැදිරිගිරිය | 16 |
| | | | ලංකාපුර | 19 |
| | | | දිඹුලාගල | 22 |
| | | | තමන්කඩුව | 26 |
| | 14 | 17 | | |

## 05. වැඩසටහන සිදු කළ ආකාරය

මෙම වැඩසටහන් සියල්ලම ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා කාල සටහනට අනුගතව සිදු කරන ලදි.


ඒ අනුව සෑම දිනකම පෙරවරු 9.00 ට වැඩසටහන ආරම්භ කළ අතර පස්වරු 4.00 අවසන් කරන ලදි. එම වැඩසටහන්වල න්‍යාය පත්‍රය අමුණා ඇත. **(ඇමුණුම් අංක 01)** යොවුන් වියේ ළමුන් සඳහා පැවැති කඳවුරු වැඩසටහන් දෙදිනක් පැවැත් වූ බැවින් එය ආරම්භක දිනයේ පෙරවරු 10.00යේ සිට පසුදා දින පෙරවරු 10.00 දක්වා පවත්වන ලදි. එම වැඩසටහන්වල න්‍යාය පත්‍රය ද අමුණා ඇත.**(ඇමුණුම් අංක 02)**


සෑම වැඩසටහනක් ආරම්භයේදීම ප්‍රශ්න 20කින් යුක්ත ප්‍රශ්නාවලියක් **(ඇමුණුම් අංක 03)**


හරහා පෙර ඇගයීම් පත්‍රිකාවක් ලබා දෙමින් වැඩසටහනේ අරමුණු සම්බන්ධව සහභාගි වන්නන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කරන ලදි. ඒ අනුව සමස්ත වැඩසටහනෙහි පෙර ඇගයීම සම්බන්ධ පහත දත්ත අපට ලැබුණි.


**06. වැඩසටහනෙහි සමස්ත ආකල්පමය ප්‍රගතිය**

**(ඉලක්ක කණ්ඩායමේ පෙර දැනුම හා පසු දැනුම පිළිබඳ අවබෝධය**










12. දරුවන්ට හා කාන්තාවන්ට ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කළ යුතු?
11. ගමේ ගැටලු විසඳීමට අවශ්‍ය අවබෝධය තිබෙන්නේද?
10. නායකත්ව කුසලතා තුළින් සතුටු පවුලක් හා සමාජයක් නිර්මාණය කිරීමට අවශ්‍යද?
9. කාන්තාව සම්බන්ධ නිතීය හා තොරතුරු ඔබ දැන ගත යුතුද?
100
35
98
35
0%
20%
40%
60%
80%
100%
ඔව්
නැත



16. මධ්‍යසාර දුම්වැටි සහ මත් ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත කරදර මෙන්ම වියදම් අවම කළ යුතුද?
15. යහපත් සන්නිවේදන කුසලතා පවුල තුළ තිබිය යුතු?
14. ගැටලු විශ්ලේෂණ හැකියාවන් ඔබ තුළ තිබෙන්නේද?
13. පවුල් සම්බන්ධතා ධනාත්මක විය යුතුද?
2
45
85
0
0%
20%
40%
60%
80%
100%
ඔව්
නැත


ඒ අනුව සමස්ත වැඩසටහනෙහි පසු ඇගයීම සම්බන්ධ පහත දත්ත අපට ලැබුණි.




12. දරුවන්ට හා කාන්තාවන්ට ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කළ යුතු?
11. ගමේ ගැටලු විසඳීමට අවශ්‍ය අවබෝධය තිබෙන්නේද?
10. නායකත්ව කුසලතා තුළින් සතුටු පවුලක් හා සමාජයක් නිර්මාණය කිරීමට අවශ්‍යද?
9. කාන්තාව සම්බන්ධ නිතීය හා තොරතුරු ඔබ දැන ගත යුතුද?
100
100
100
100
0%
20%
40%
60%
80%
100%
ඔව්
නැත


16. මධ්‍යසාර දුම්වැටි සහ මත් ද්‍රව්‍ය භාවිතය ආශ්‍රීත කරදර මෙන්ම වියදම් අවම කළ යුතුද?
15. යහපත් සන්නිවේදන කුසලතා පවුල තුළ තිබිය යුතු?
14. ගැටලු විශ්ලේෂණ හැකියාවන් ඔබ තුළ තිබෙන්නේද?
13. පවුල් සම්බන්ධතා ධනාත්මක විය යුතුද?
0
0
0
0
0%
20%
40%
60%
80%
100%
ඔව්
නැත




## 05. අදහස් හා යෝජනා

වැඩසටහන ආරම්භයේදී ඉලක්ක කණ්ඩායම් විසින් ලබා දුන් ප්‍රතිචාර මත ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳවත් , උපදේශනය පිළිබඳවත් මානසික ගැටලු හා රෝග යනුවෙන් කොටස් දෙකක් ඇති බවත් මානසික ගැටලු හා රෝග සුව කළ හැකිද යන්න පිළිබඳවත් නිසි අවබෝධයක් නොමැති බව අවබෝධ විය. මේ අනුව ග්‍රාමීය මට්ටමේ ප්‍රජාව තුළ තව දුරටත් අධිකව පුරුෂාධිපත්‍ය තිබෙන බව ඉතාමත් පැහැදිළි විය. එය අප විසින් නැගූ පහත ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරු අනුව ද පැහැදිළි විය. පිරිමිකම හෝ පුරුෂාධිපත්‍ය නිසා පිරිමින්ට සිදු වන අසාධාරණයන් තිබෙන්නේද පිරිමිකම හෝ පුරුෂාධිපත්‍ය නිසා ගැහැනුන්ට සිදු වන අසාධාරණයන් තිබෙන්නේද කාන්තාවක් හා ගැහැණු දරුවෙකු වීම නිසාම සිදු වන අසාධාරණකම් තිබෙන්නේද? ඔවුන් ඒ පිළිබඳ නොදන්නා බව අදහස්වලින් දක්වන ලදි.

එමෙන්ම ගමේ ගැටලු විසඳීමට අවශ්‍ය අවබෝධය නොමැති බවත් ඒ නිසාම සමහර අවස්ථාවලදී විවිධ ගැටලු නිරාකරණයට ගොස් ඔවුන්ට පෙරළා තවත් ගැටලු රාශියකට මුහුණ දෙන්නට සිදු වන බව දක්වන ලදි. එමෙන්ම පහත ඉලක්ක එනම්

01.එම අසාධාරණකම් අවම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය

02. තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී කාන්තා සහභාගිත්වය වැඩි කළ යුතුය

03. මානව සම්බන්ධතා යහපත් කිරීම හා සංවර්ධනය කිරීමට අවශ්‍ය වේ

04. කාන්තාව සම්බන්ධ නිතීය හා තොරතුරු ඔබ දැන ගත යුතුය

05. නායකත්ව කුසලතා තුළින් සතුටු පවුලක් හා සමාජයක් නිර්මාණය කිරීමට අවශ්‍ය වේ

06. දරුවන්ට හා කාන්තාවන්ට ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කළ යුතුය

ඔවුන්ට ඇතත් ඒ සඳහා පුහුණු හෝ ආදාළ අවස්ථාවන් නොලැබෙන බව දක්වන ලද අතර මෙම වැඩසටහන එම නිසාම ප්‍රශංශනීය බව විස්තර වශයෙන් දක්වන ලදි. වැඩසටහන් තිබුණද මේ අකාරයට අවශ්‍ය ක්‍රමෝපායන් ඉදිරිපත් කරමින් දැනුම ලබා දෙන මෙන්ම ගම තුළ නියෝජිතයන් පුහුණු කර ඒ හරහා තොරතුරු ලබා ගැනීමේ අපගේ වැඩසටහන ඔවුන් අගය කරන ලදි. එය කාලීන අවශ්‍යතාවයක් මෙන්ම එය පසුවිපරම් සහිතව සිදු කළ යුතු බව ඔවුන්ගේ දැක්වීමයි.

එමෙන්ම පහත යෝජනාද ඉදිරිපත් විය

**01. මෙම වැඩසටහන ඉතා වැදගත් බවත් එය ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු බවත්**

**02. වැඩසටහන සඳහා ඉලක්ක කණ්ඩායම්වලින් දහම් පාසල් ගුරුවරුන් යොදා ගැනීම ඉතා වැදගත් බව**

**03. පසු විපරම් වැඩසටහනක් හා ඊට ප්‍රතිපාදන වෙන් විය යුතු බව**

**04. ග්‍රාමීය මට්ටමින් ප්‍රජා නායකයන් පුහුණු කර ඒ අනුව ගැටලු සෘජුව ලබා ගැනීමේ ක්‍රම වේදයක් මේ තුළින් සකස් කළ යුතු බව**

**05. ඒ කෙසේද යන්න පිළිබඳ සාකච්ඡා සැළසුම් සකස් කිරීම**

**06. විධිමත් කාලයක් හා සැළසුමක් මඟින් මෙවැනි වැඩසටහන් ක්‍රියාවට නැගීම**